# කතිරයේ බලය

වෙළුම 1 කලාපය 1 මැතිවරණ කොමිෂන් සභාව 2017 ඔක්තෝම්බර් - දෙසැම්බර්

## සංස්කාරක සටහන

මැතිවරණ කොමිෂන් සභාව විසින් ස්වකීය අරමුණු හා අභිමතාර්ථ සාධනය කරගනු වස් 2017-2020 කාල රාමුව සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ සියලූම පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වා ලබා ගන්නා ලද අදහස්, යෝජනා හා නවෝත්පාදන සංකල්ප/ අදහස් තුළින් මෙම උපාය මාර්ග සැලසුම පෝෂණය වී ඇත.

හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර (Trust Areas) යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් අලලා කාර්තුමය වශයෙන් කෙටි පුවත් සඟරාවක් (News Letter) එළි දැක්වීම ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස දක්වා ඇත. කොමිෂන් සභාවේ විෂය මූලික ක්ෂේත්‍ර හා වාර්ෂික ප්‍රධාන ක්‍රියාකාරකම් තේමා කොටගෙන මෙවැනි කාර්තුමය පුවත් සඟරාවක් එළි දැක්වීම කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

ඒ අනුව "ලෝක ප්‍රජාතන්ත්‍රවාදී" දිනය වූ සැප්තැම්බර් 15 දිනය කේන්ද්‍රකොට ගෙන පළමු කලාපය නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී දිනය වෙනුවෙන් "ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රකාශනය ඡන්ද බලයයි සර්වජන ඡන්ද බලය සුරකිමු." යන්න තේමාව කොට ගෙන මැතිවරණ කොමිෂන් සභාව විසින් ලංකාව පුරා ජනතාව දැනුවත් කිරීමේ වැඩමුළු, දේශන, වීදි නාට්‍යය, බැනර්, පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම, අත් පත්‍රිකා බෙදාහැරීම වැනි වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන්වල ඡායාරූප ද මෙම පුවත් සංග්‍රහයට ඇතුලත් වී ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන ජනතාවගේ මූලික අයිතිවාසිකමක් වූ ප්‍රජාතන්ත්‍රවාදය හා සර්වජන ඡන්ද බලය මූලික තේමාව කොට ගෙන මැතිවරණ කොමිෂන් සභාවේ පළමු පුවත් සඟරාව වූ "කතිරයේ බලය" එළි දැක්වීමට හැකිවීම සතුටට කරුණකි. සම්ප්‍රදායික පුවත් සඟරා ආකෘතියෙන් බැහැරව කොමිෂන් සභාවට අනන්‍ය වූ විෂය මාතෘකා මූලික තේමාව කොට ගෙන මෙම පුවත් සඟරාව එළි දැක්වේ. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා නිසි උපදෙස් හා මඟපෙන්වීම ලබා දුන් කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා එහි සාමාජික ජනාධිපති නීතිඥ නලින් ජේ.අබේසේකර මහතා, මහාචාර්ය රත්නජීවන් එච්.හූල්, මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්, ලේකම් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය වෙත සහ මුද්‍රණ ආකෘතිය හා පිටු සැලැස්ම සකස් කොට දුන් ශ්‍රී ලංකා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ කේ.ඩබ්ලිව්.ජගත් චන්ද්‍රලාල් ද සිල්වා මහතා වෙත අපගේ කෘතඥතාව හිමිවේ.

**මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ හෝ අදහස් ප්‍රකාශ නොවේ.**

## ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රකාශනය ඡන්ද බලයයි. ප්‍රජාතන්ත්‍රවාදයේ මහෝත්සවය ඡන්ද විමසීමයි.

මිනිසා උපතින්ම නිදහස්. නිදහස උත්පත්ති අයිතියක්. එලෙසින්ම මිනිසා උපතින් කිසිවකුටත් යටත් හෝ දෙවැනි වන්නේ නැහැ. මිනිසා උපතින්ම සමානයි.

නූතන ලෝකයේ මිනිස්කම නැත්නම් මිනිස් අයිතිය, ඒ කියන්නේ මානව හිමිකම් පදනම් වන්නේ අන්න ඒ පදනම මතයි. මිනිස්කම අර්ථවත් වෙන්නේ සෑම හිමිකමක්ම සෑම දෙනාටම හිමිවීම මගින්.




සමාජයකට අරාජිකව පවතින්න බැහැ. ක්‍රම සහ විධි පද්ධතියක් මගින් පිළිවෙලක් පිහිටුවා ගන්නේ නැත්නම් එවැනි සමාජයක් අවුල් ජාලාවක් බවට පත් වෙනවා. එසේ වුවහොත් මිනිස්කමෙහි උතුම්ම දායාදය වන හිමිකම් නැතිව යනවා.

අපේ උත්පත්ති අයිතීන් වන නිදහස සහ සමානාත්මතාවයට ගරු කැරෙන වත්මන් ලෝකයේ පවත්නා වඩාම සාරවත් සමාජ සංවිධාන මෙවලම තමයි ප්‍රජාතන්ත්‍රවාදය. එම වචනය බිදී එන්නේ ජනයා විසින් ජනයා පාලනය කිරීම යන අරුත දෙන ග්‍රීක වචනයකින්. නමුත් ලොව පුරා පැවැති පැරණි සංස්කෘතීන් බොහොමයක වාගේ ජනයා විසින් ජනයා පාලනය කර ගැනීමේ ලක්ෂණ පැවැත තිබෙනවා.

ජනයා විසින් ජනයා පාලනය කර ගැනීමේ සංකල්පය පරිණාමනය වී අද අප භාවිත කරන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගී තිබෙනවා. ඊට හේතුව තමයි ලක්ෂ සංඛ්‍යාත ජනකායකට සෘජුවම සමාජය සංවිධානය කර ගැනීම, වෙනත් වචනයකින් කියන්නේ නම් රාජ්‍ය පාලනයට සම්බන්ධ වෙන්න ක්‍රමයක් නැති නිසා.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ නිසි කාල අන්තරයන්හි පැවැත්වෙන මැතිවරණයන්හිදී ඡන්දයෙන් නිශ්චිත කාලයකට නියෝජිත-නියෝජිතවරියන් පත් කරගැනීම මගින් ආණ්ඩුකරණය පවත්වා ගැනීමයි.

ඡන්දය සහ ප්‍රජාතන්ත්‍රවාදය අතර පවතින්නේ අභේද්‍ය බැඳීමක්. එකක් නැතිව අනෙක පවතින්නේ නැහැ.

මුල් කාලයෙහි රාජ්‍ය පාලන නියෝජිතයින් පත්කර ගැනීමේ මැතිවරණයන්හි දී ඡන්ද බලය තිබුණේ තෝරාගත් පිරිසකට පමණයි. උදාහරණයක් විදිහට ස්ත්‍රීන්ට බොහෝ රටවල ඡන්ද බලය ලැබුණේ විශාල උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් විදිහට.

සර්වජන ඡන්ද බලයෙන් තමයි මේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය මල්පල ගැන්වෙන්නේ. ඒ කියන්නේ කවුද, කොහොන්ද, කොයිවගේද නොසලකා සෑම පුරවැසියකුටම එක් ඡන්දයක් පමණක් හිමි ක්‍රමය. සර්වජන ඡන්දය කියන්නේ හැමදෙනාගේ කැමැත්ත එක සමානව ප්‍රකාශ කිරීමේ මෙවළම.

ඕනෑම සමාජ පද්ධතියක සාමාජික සාමාජිකාවන්ගෙන් කවරෙකු හෝ ගන්නා තීරණයක් එම පද්ධතියටම බලපාන නිසා, එහි කොටස්කරුවන් වන හැමදෙනාටම තීරණ ගැනීම සදහා සහභාගි වීමේ අයිතිය සම සමව තිබීම අවශ්‍යයි. එයයි සර්වජන ඡන්ද බලයේ වටිනාකම.

හැබැයි සර්ව ජන ඡන්දයේ නියම බලය මහජනයාට ලැබීමට නම් තවත් සාධක ගණනාවක් සම්පූර්ණවීම අවශ්‍යයි. කෙටියෙන් මැතිවරණ, නිදහස් සහ සාධාරණ විය යුතුයැයි කියන්නේ ඒ නිසයි.

මැතිවරණයක් නිදහස් සහ සාධාරණ වීමට නම් ප්‍රථමයෙන්ම තමන් කැමැති නියෝජිතයා තෝරා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු මහජනයාට නිදහසේ සමානව ලැබිය යුතුයි.

මැතිවරණ අවස්ථාවෙහි ජනමාධ්‍ය භූමිකාව වැදගත් වන්නේ මෙතැනදි. ජනමාධ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදී භූමිකාව තමයි දැනුවත් පුරවැසියකු බිහිකිරීම. පුරවැසියා දැනුවත් නැත්නම් සර්වජන ඡන්දය අපතේ යනවා.

එපමණක් නොවෙයි ඕනෑම මැතිවරණයකදී එයට ඉදිරිපත්වන සෑම දෙනාටම, සෑම දේශපාලන පක්ෂයකටම සිය ප්‍රචාරක ව්‍යාපාර සඳහා සමාන ඉඩ ප්‍රස්ථා තියෙන්න ඕන. ධනය සහ බලය නිසා කවර හෝ අපේක්ෂකයකුට හෝ පක්ෂයකට වැඩි අවස්ථා තියෙන්න බැහැ. එහෙම වුනොත් අප මුලින් කී සමානාත්මතාවය නැතිව යනවා.

03 පිටුවට...



## ප්‍රජාතන්ත්‍රවාදයේ බලකුණු

- ජනතාවගේ ස්වෛරීභාවය
- පාලනය කරනු ලබන ජනතාවගේ කැමැත්ත මත පිහිටුවනු ලබන රජය
- බහුතර පාලනය
- සුළුතර අයිතිවාසිකම්
- මූලික අයිතිවාසිකම් සහතික කිරීම
- නිදහස් හා සාධාරණ මැතිවරණ
- නීතිය ඉදිරියේ සමානාත්මතාව
- නීතිය නිසි ලෙසින් ක්‍රියාත්මක වීම
- රජය කෙරෙහි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් නියම වන සීමාවන්
- සමාජ, ආර්ථික හා දේශපාලනමය බහුත්වය හෙවත් විවිධත්වය
- ඉවසා දරා ගැනීමේ, උපයෝගීතාවේ, සහයෝගයේ හා සමඟි සම්මුතියේ සාරධර්ම



## මූලික මානව අයිතිවාසිකම්

- කථා කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා පුවත්පත් නිදහස
- ආගමික නිදහස
- රැස්වීම පැවැත්වීමේ හා සමිති සමාගම් පිහිටුවා ගැනීමේ නිදහස
- නීතියෙන් සමාන ආරක්ෂාවක් ලැබීමේ අයිතිවාසිකම්
- නීතියේ නිසි ක්‍රියාදාමය හා සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතිය

# බහුතරයේ කැමැත්ත ප්‍රජාතන්ත්‍රවාදය නොවේ

ග්‍රීක පෞර රාජ්‍යයේ නගර ශාලාවට රැස් වූ පුරවැසියෝ පොදු කාරණා පිළිබඳව තීරණ ගත්හ. මෙම පාලන ක්‍රියාදාමය ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් නම් එක් අවධියක දී හඳුනා ගනු ලැබ තිබුණි.එකල පැවති ආකාරයේ පාලනයක් අද (එනම් විසි එක්වන සියවසේ දෙවන දශකයේ) පවතින්නේ නම් අපි එය ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් හඳුන්වමු ද? පැහැදිලිවම අපි එසේ නොකරමු. මන්ද, ග්‍රීක පෞර රාජ්‍යයේ පාලන කටයුතු පිළිබඳ තීරණ ගැනීම සඳහා සහභාගි වූයේ එනම්, පුරවැසියන් ලෙස සලකන ලද්දේ ජනගහණයෙන් සියයට විස්සක් පමණ වූ පිරිසක් නිසාය. ස්ත්‍රීන්, වහලුන්, ආගන්තුකයන් සහ ඇතැම් වැඩ කරන පන්තිවල ජනයාට පාලන කටයුතුවලට සහභාගි වීමේ අවස්ථාව අහිමි කරනු ලැබ තිබුණි.

පෞර රාජ්‍යයේ සිට නොයෙකුත් වෙනස්කම්වලට බඳුන් වෙමින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදයට විවිධ කාලවල දී විවිධ අර්ථ ගැන්වීම් ලබා දී ඇත. දහ හත්වන සියවසේ දී බ්‍රිතාන්‍යයේ පැවති රාජාණ්ඩු ක්‍රමයට එරෙහිව මහජන නියෝජිතයන් මගින් සිදු කෙරෙන පාලනය, එනම් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ඉස්මතු වුණි.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපගේ සාකච්ඡාව ඉදිරියට ගෙන යාම සඳහා එයට යම් අර්ථ ගැන්වීමක් කළ යුතු වෙයි. මෙහි දී අපි මහාචාර්ය උල්ල ටෝන්ක්විස්ට්ගේ අර්ථ ගැන්වීම යොදා ගනිමු. ඔහු ප්‍රජාතන්ත්‍රවාදය සංකල්පගත කර ඇත්තේ:"පොදු කටයුතු සම්බන්ධයෙන්, දේශපාලන සමානත්වය මත පදනම්ව සිදු කෙරෙන්නා වූ මහජන පාලනයයි" යනුවෙනි. ඔහු සහභාගිත්වය සහ නියෝජනය (වෙනත් කරුණු අතර) ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණ ලෙස හඳුනා ගෙන ඇත. මෙම අර්ථ ගැන්වීම අනුව ප්‍රජාතන්ත්‍රවාදයේ කේන්ද්‍රීය අක්ෂය වනුයේ මහජන පාලනයයි. මෙහි එක් වැදගත් ඇඟවීමක් ඇත. එනම්, යහපත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා මහජනතාව දේශපාලන ක්ෂේත්‍රයට ගොනු කළ යුතු බවය. මෙහි දී දේශපාලනය යන්න පුළුල් අර්ථයෙන් යෙදෙයි. මැතිවරණ කටයුතුවල නිරත වීම පමණක් නොව ඡන්දය පාවිච්චි කිරීම සහ පොදු කටයුතු පිළිබඳව තම මතය පළ කිරීම පවා දේශපාලන ක්‍රියාවන්ය. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාව නිරතුරු භාවිත කරන "ඡන්දය ඔබේ අයිතියයි" යන පාඨයට සුවිශේෂී අරුතක් ඇත්තේ එබැවිනි.

යහපත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සඳහා සහභාගිත්වය සහ නියෝජනය අතිශයින් වැදගත් වෙයි. ඒ සඳහා, සර්වජන ඡන්ද බලය, නියමිත කාලයක දී පැවැත්විය යුතු නිදහස් සහ සාධාරණ මැතිවරණ, බහු පක්ෂ ක්‍රමයක පැවැත්ම සහ සංවිධානය වීමේ නිදහස ආදිය වැදගත් වෙයි. පොදු කටයුතු සම්බන්ධයෙන් මහජන පාලනයක් පැවතීමට ඒවා ඉවහල් වන බැවිනි.

මැතිවරණයක දී දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් ඉදිරි වසර කිහිපයක් සඳහා රටේ හෝ යම් ප්‍රදේශයක පාලන බලය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් තරග වදී. තම පාලනයට පදනම් වන්නා වූ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් වේ. නියෝජිතයන් වශයෙන් කටයුතු කිරීමට අපේක්ෂා කරන තැනැත්තෝ මැතිවරණයට ඉදිරිපත් වෙති. ඡන්දදායකයෝ ප්‍රකාශයට පත්ව ඇති ප්‍රතිපත්ති මෙන්ම අපේක්ෂකයාගේ සුදුසු නුසුදුසුකම් සහ කුශලතා ආදිය සලකා බලා පාලන කටයුතු සඳහා තම නියෝජිතයන් තෝරා පත් කර ගනිති. මෙය ඉහත කී මහජන පාලනයේ ප්‍රධානතම ආකාරයයි. මෙහි දී ජනතාව නියෝජිතයන් මගින් මහජන පාලනයට සම්බන්ධ වෙති.

තෝරා පත් කර ගනු ලැබූ නියෝජිතයෝ ඔවුනට ඡන්දය දුන් නොදුන් සැම දෙනා වෙනුවෙන්ම පාලන කටයුතුවල නිරතවෙති. මහජන පාලනය යනු එක් පිරිසකගේ පාලනය නොව සමස්ත ජනතාවගේම පාලනයයි. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ එය හුදෙක් බහුතරයේ යහපත පමණක් උදෙසා සිදු කරන්නා වූ පාලනයක් නොවේ. ජන සමාජය තුළ නොයෙක් ආකාරයේ බෙදීම් පවත්නා විට ඒ ගැන නිසි සැලකිල්ල යොමු නොකරමින් යම් ජන කොටස්වල යහපත නොතකා හරිමින් එක්තරා ජන කොටසක විශ්වාසය සහ සහයෝගය පමණක් අරමුණු කර ගෙන පාලන කටයුතු පවත්වා ගෙන ගියහොත් එහි පවතින්නේ ප්‍රජාතන්ත්‍රවාදය නොවේ.

**1994ට පෙර වසර පනහක පමණ කාලයක් දකුණු අප්‍රිකාවේ පැවති වර්ණ භේදවාදී පාලනය මේ සඳහා කදිම නිදසුනකි. එහි දී, කළු ජාතික ජන කොටස් අතිශයින් පීඩනයට පත් කරන්නා වූ නීති ක්‍රියාත්මක කෙරුණි. සුදු ජාතිකයන් පදිංචි ප්‍රදේශවලින් බැහැරව ජීවත් වීමට ඔවුනට බල කෙරුණි. සුදු සහ කළු ජාතිකයන් අතර විවාහ තහනම් කෙරුණි. ඔවුන් අතර සමාජීය එකමුතුවක් ඇති විය හැකි අවස්ථා අහෝසි කෙරුණි. මෙ සියල්ල කෙරුණේ නීතිමය රාමුවක් තුළය. එහෙත් එකී පාලනය ප්‍රජාතන්ත්‍රවාදී නොවුණේ එය කළු ජාතීන්ට අගතිදායක එකක් වූ නිසාය.සමාජයේ යම් කොටසකගේ අයිතිවාසිකම් අහිමි කරනු ලබන ඔවුනට වෙනස්කම් කරනු ලබන පාලනයක් (පාලකයන් නීත්‍යානුකූල මැතිවරණයකින් පත් වී තිබුන ද) කිසි ලෙසකින් වත් ප්‍රජාතන්ත්‍රවාදී වන්නක් නොවේ.**

බහුතර කැමැත්ත මත පත් වූ පමණින් බහුතර නියෝජිතයන්ගේ එකඟත්වය අනුව ක්‍රියාත්මක වූ පමණින් එය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් යැයි කිව නොහැකිය. එය සුළුතර ජන කොටස්වලට අගතිදායක ලෙසින් ක්‍රියාත්මක වන්නේ නම් එහි පවතින්නේ බහුතරයේ පීඩාකාරී පාලන තන්ත්‍රයත් නැතහොත් බහුතරයේ ප්‍රජා පීඩක පාලනයකි.ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් කිසි විටෙක සුළුතරයට අගතියක් ගෙන දෙන්නා වූ පාලනයක් නොවන්නේය. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී පාලක පක්ෂය සුළුතරය ගැන කෙතෙක් දුරට නොසිතන්නේ ද නොතකන්නේ ද එතෙක් දුරට එම පාලනය ප්‍රජාතන්ත්‍ර විරෝධී වෙයි.

ජන සමාජය තුළ විවිධාකාරයේ බෙදීම් ඇති විට දී මෙම තත්වය ගැන විශේෂිත අවධානයක් යොමු කළ යුත්තේ එසේ නොවුණ හොත් සුළුතරයේ ප්‍රතිචාරය ප්‍රජාතත්ත්‍ර විරෝධී එකක් දක්වා ව්‍යාප්ත වීමේ අනතුරක් පවත්නා බැවිනි. පාලක පක්ෂයට සුළුතරය ගැන සිතීමට පෙළඹ වීමේ අතිශයින් සාර්ථක ක්‍රමයක් වනුයේ සුළුතරයේ නිල නියෝජනය පුළුල් කිරීමයි. මෙය විවිධාකාරයෙන් කල හැක්කකි. සන්ධීය ක්‍රමය වැනි බලය බෙදා හැරීමේ ක්‍රම, බහු මන්ත්‍රී ආසන පිහිටු වීම, සුළුතරය සඳහා පත් කල මන්ත්‍රී ධුර ලබා දීම, උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පිහිටු වීම මගින් සුළු ජන කොටස්වලට වැඩි නියෝජනයක් ලබා දීම මේ සඳහා යොදා ගෙන ඇත. කෙසේ වෙතත්, අවසන් වශයෙන්මෙම ප්‍රශ්නයට විසඳුමක් ඇත්තේ සුළුතරයට ගරු කරන බහුතරයක් ඇති සංස්කෘතියක් තුළ පමණි.

- නීතිඥ ප්‍රසන්න ද සොයිසා











## ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රකාශනය.....

මැතිවරණ අවස්ථාවන්හිදී මැතිවරණ කොමිසමට මේ සියලු සාධක සමබරව තබා ගැනීමට වගකීමක් තිබෙනවා. මොකද මැතිවරණය නිදහස් සහ සාධාරණ වන්නේ එම සාධක සමබර වූ විට පමණක් නිසා. අන්න එතකොට තමයි සර්වජන ඡන්දයට හිමි නියම තැන ලැබෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීම හුදෙක් නියෝජිත - නියෝජිත්වරියන් පත් කරගැනීමට සීමා වූ ක්‍රියාවක් පමණක් නොවෙයි. එය සංස්කෘතියක් වෙන්න ඕන. ඒ කියන්නේ ආණ්ඩුකරණය සම්බන්ධයෙන් සිය අදහස් දැක්වීමට මහජනයාට ඇති අයිතිය ලෙස තමයි එය සමාජ ගතවෙන්න ඕන.

ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙත් මිනිස්කම සුරකින මෙවළම. සෑම මානව හිමිකමක්ම ඇතුළත් කරගත් දැක්මක්. සංස්කෘතියක්. ඔය විදිහට ප්‍රජාතන්ත්‍රවාදය සහ සර්වජන ඡන්ද අයිතිය විසින් සිය අදහස්වලට වටිනාකමක් ඇති බව මහජනයාට හැඟීමක් ඇති කරනවා. අපේ හිමිකම් රැකගැනීම සඳහා මෙන්ම ජීවිතය යහපත් කර ගැනීම සඳහා කටයුතු කිරීමට අපට ඒ විසින් අවස්ථාවක් උදා කර දෙනවා.

ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමට සර්වජන ඡන්දය අවශ්‍යයි. ප්‍රජාතන්ත්‍රවාදය නැත්නම් සර්වජන ඡන්ද බලය ලැබෙන්නේ නැහැ. හරියට එකම කඹයක වෙලුම් නැත්නම් පොටවල් දෙක වාගෙයි.

ඒ නිසා අපට මේ වෙලුම් දෙකම අවශ්‍යයි. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රකාශනය ඡන්ද බලයි; ප්‍රජාතන්ත්‍රවාදයේ මහෝත්සවය ඡන්ද විමසීමයි. කියන්නේ අන්න ඒ නිසා.

**ලෝක ප්‍රජාතන්ත්‍රවාදී දිනය සමරමු.**

**සර්වජන ඡන්ද බලය සුරකිමු.**

- අසෝක ජයවර්ධන

## කාන්තා නියෝජනය හා සබැඳි ලෝකයේ පළමු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්



නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳ කතාබහ සමඟ ජනතා නියෝජිතයන් අතර කාන්තා නියෝජනය පිළිබඳ අලුතින් කතාබහක් ඇතිව තිබේ. ශ්‍රී ලංකාව පාර්ලිමේන්තුවේ සහ අනෙකුත් ඡන්දයෙන් පත්වන මහජන නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය අඩුම රටකි. 2015 අගෝස්තු මැතිවරණයෙන් පසු තෝරාගන්නා ලද පාර්ලිමේන්තුවේ සමස්ථ මන්ත්‍රීන් 225 න් 13 දෙනකු කාන්තාවන් වූ අතර එය සියයට 5.8 ක ප්‍රතිශතයක් විය. මේ අනුව ශ්‍රී ලංකාව කාන්තා නියෝජනය අතින් රටවල් 187 ක් අතුරින් 178 වන ස්ථානයේ සිටියි.

මෙහි අයහපත් තත්ත්වය නම් ජනගහනයෙන් බහුතරයක් වන කාන්තාවන් රටේ නීති සැදෙන පාර්ලිමේන්තුවේ නියෝජනය නොවීමයි. විශේෂයෙන්ම කාන්තාවන්ට බලපාන කරුණු සම්බන්ධව වුවද නීති සම්මත කෙරෙන්නේ පිරිමින් විසින් වීම එක්තරා ආකාරයකින් කණගාටු වියයුතු කරුණකි.

ලෝකයේ පළමු වතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් තෝරාපත් කරගන්නා ලද්දේ 1907 දී ෆින්ලන්තයයි. මෙකල ෆින්ලන්තය රුසියාවේ පාලනය යටතේ පැවතුන අතර එරට නෛතික වශයෙන් මහාදිපාද ප්‍රදේශයක් ලෙස සැලකුණි. ඊට වෙනම පාර්ලිමේන්තුවක් ද විය. 1906 දී ෆින්ලන්තය සර්ව ජන ඡන්ද බලය සිය ජනතාවට ප්‍රදානය කළ පළමු යුරෝපීය රට බවට පත් වූ අතර කාන්තාවන්ට ෆින්ලන්ත පාර්ලිමේන්තුවට තේරී පත්වීමට අවස්ථාව ලබාදෙන ලදී. මෙම නව මැතිවරණ නීති යටතේ පැවති පළමු මැතිවරණය 1907 මාර්තු 15 සහ 16 දිනවල පවත්වනු ලැබිණ.

මෙම මැතිවරණයේ දී පාර්ලිමේන්තු ආසන 200 න් 80ක් ම දිනාගනු ලැබුයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසිනි. ෆින්වරුන්ගේ පක්ෂය (Finnish Party) ආසන 59 ක්, තරුණ ෆින්වරුන්ගේ පක්ෂය (Young Finns' Party) ආසන 26 ක්, ස්වීඩන් ජනතා පක්ෂය (Swedish People's Party) ආසන 24 ක්, ගොවිජන ලීගය (Agrarian League) ආසන 9 ක් සහ ක්‍රිස්තියානි කම්කරු පක්ෂය (Christian Workers' Party) ආසන 2 ක් දිනාගත්හ. මෙහි ස්වීඩන් ජනතා පක්ෂය යනු ෆින්ලන්තයේ වසන ස්වීඩන් ජාතිකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් බිහි වූ පක්ෂයකි.

මෙම මැතිවරණයේ දී පත් කරගන්නා ලද මන්ත්‍රීවරුන් 200 දෙනාගෙන් කාන්තාවන් සංඛ්‍යාව 19 ක් විය. ප්‍රතිශතයක් ලෙස ගත් විට එය සියයට 9.5 කි. එනම්, 1907 වසරේදී ෆින්ලන්ත පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 2015 දී ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ විය.

මෙහිදී වැදගත්වන අනෙක් කරුණ නම් මෙම කාන්තා නියෝජනය එක් පක්ෂයකට පමණක් සීමා නොවීමයි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් නියෝජිතවරියන් නව දෙනෙක්, ෆින්වරුන්ගේ පක්ෂයෙන් නියෝජිතවරියන් හත් දෙනෙක්, තරුණ ෆින්වරුන්ගේ පක්ෂයෙන් නියෝජිතවරියන් දෙදෙනෙක් සහ එක් ස්වීඩන් ජනතා පක්ෂ නියෝජිතවරියක් වශයෙන් මෙම නියෝජිතවරියන් තෝරා ගන්නා ලදී. මෙයින් ලාබාලම මන්ත්‍රීවරිය වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉඩා ආලේ-ටෙල්යෝ (Ida Aalle-Teljo) ය. පාර්ලිමේන්තුවට තේරී පත් වනවිට ඇය 22 වන වියෙහි වූවාය.

ෆින්ලන්ත පාර්ලිමේන්තුවේ අදටත් පවතින්නේ ආසන 200 කි. 2015 පැවති ෆින්ලන්ත මැතිවරණයේ දී පත්වූ මන්ත්‍රීන් 200 දෙනාගෙන් 84 දෙනෙකුම මන්ත්‍රීවරියන් ය. එය සියයට 42 ක ප්‍රතිශතයක් වන අතර කාන්තා නියෝජනය අතින් ෆින්ලන්ත පාර්ලිමේන්තුව ලොව අටවැනි ස්ථානයේ සිටියි.

- චාමර සුමනපාල









# ප්‍රජාතන්ත්‍රවාදය

මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රජාතන්ත්‍රවාදය හා ඡන්ද බලයේ වටිනාකම පිළිබඳව පාසැල් ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජිතයන් නගන පොදු ප්‍රශ්නවලට අවධානය යොමු කිරීමේ දී ලෝක ප්‍රජාතන්ත්‍රවාදී දිනය යෙදෙන සැප්තැම්බර් 15 දින ප්‍රජාතන්ත්‍රවාදය හඳුනා ගැනීම පිළිබඳව සටහනක් තැබීම කාලෝචිතය. ප්‍රජාතන්ත්‍රවාදය යන්නට ඉංග්‍රීසියෙන් යෙදෙන්නේ Democracy ලෙසය. මෙහි නිරුක්තිය ග්‍රීක වචනවලින් උත්පාදනය වී ඇති අතර, එය Demo - ජනතාව kratos - පාලනය යන්නයි. ප්‍රජාතන්ත්‍රවාදය තරම් විවාදයට ලක් වූ චින්තනයක් ඉතා විරල අතර, එයට දී ඇති විවිධ අර්ථ කථනයන්ගෙන්ද අඩුවක් නොමැත. දේශපාලන දාර්ශනිකයන්ගේ සිට විවිධ විද්වතුන්ගේ මත දැක්වීම් ප්‍රජාතන්ත්‍රවාදයේ අර්ථ නිරූපණයට වඩා එහි ස්වාභාවය හඳුනා ගැනීමට කරන ලද ප්‍රයත්නයක් ලෙස දැකිය හැකිය. 1863 **දී ඇමරිකානු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් ගෙටිස්බර්ග් නුවරදී ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වූයේ "ජනතාව විසින් ජනතාව උදෙසා කරන මහජන පාලන තන්ත්‍රය" ලෙසය. ස්පාඤ්ඤ ජාතික මිගෙල් ද ස්වාන්ට් ගේ අදහස වූයේ, "නිදහස වූ කලී මිනිසා ස්වර්ගයෙන් ලත් මාහැඟි වස්තුවක් බවය". "සියලු නීත්‍යානුකූල පාලන රඳා පවතින්නේ ජනතාවගේ කැමැත්ත මත" බව, ජෝන් ලොක් (1680 ) ප්‍රකාශ කර ඇත.**

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය පවතින බව පවසන රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙස බලන විට එම නිර්වචනයන් හා යථාර්ථවාදී ක්‍රියාකාරීත්වය අතර විශාල වෙනස්කම් පවතී. අප්‍රිකානු මහද්වීපයේ ඇතැම් රටවල්, ලතින් ඇමරිකානු රටවල් හා ආසියානු රටවල් වැනි එකිනෙකට පටහැනි විවිධ ආණ්ඩුක්‍රම පවතින රටවල් පවා තම රටවල ප්‍රජාතන්ත්‍රීය පාලන ක්‍රම පවත්නා බව ප්‍රකාශ කරයි. කොමියුනිස්ට්වාදී පාලන ක්‍රමයේ ස්වරූපය ඇති රටවල් පවා ප්‍රකාශ කරන්නේ එම පාලන තන්ත්‍රයන්ද ප්‍රජාතන්ත්‍රවාදී බවය. මෙයින් පෙනී යන්නේ "ප්‍රජාතන්ත්‍රවාදී" පාලන තන්ත්‍රය සියල්ලන්ටම ප්‍රතික්ෂේප කළ නොහැකි දේශපාලන පරමාදර්ශයක් බවට පත්ව ඇති බවය. ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල පාලන ක්‍රමයක් ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබුවේ, ඉතාලියේ බෙනිටෝ මුසෝලිනී ප්‍රමුඛ පැසිස්ට්වාදීන් විසින් පමණකි. කොමියුනිස්ට් ස්වරූපයේ රටවල නිදහස් හා ස්වාධීන මාධ්‍ය පැවැත්මක් නොමැති නිසා ඒවා ප්‍රජාතන්ත්‍රවාදී නොවන බව බටහිර ලිබරල්වාදීන් දක්වන අතර, මහාචාර්ය බර්නාඩ් කික් පවසන්නේ බහු ජනතාවගේ සහාය ඇතිව විශේෂ පාලනයක් ගෙන යාම නිසා කොමියුනිස්ට් රටවලට ද ඔවුන් ද ප්‍රජාතන්ත්‍රවාදී බව කියා ගැනීමට අයිතියක් ඇති බවය. "ආඥාදායක ප්‍රජාතන්ත්‍රවාදයක් Totalitarian Democracy පැවතිය හැකි බවද, මහාචාර්ය කික් පවසයි. ඒ සඳහා උදාහරණ ලෙස දක්වා ඇත්තේ එවකට සැම්බියාවේ ජනාධිපති කෙනත් කවුන්ඩාගේ සහ ටැන්සානියාවේ ජුලියස් නියරේරේගේ පාලන ක්‍රමයන්ය.

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලයන් හා ප්‍රභවයන් සොයා යන විට ප්‍රධාන අවස්ථා කීපයක් හඳුනාගත හැකිය. එයින් ග්‍රීක ප්‍රජාතන්ත්‍රවාදය මූලික වේ.

## ග්‍රීක ප්‍රජාතන්ත්‍රවාදය




ක්‍රි.පූ - 4-5 ශත වර්ෂවල ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය (Polis) තුළ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික බීජයන් දැකගත හැකිය. ග්‍රීසියේ පැවති විවිධ ආණ්ඩුක්‍රම 158 ක් ගැන ඇරිස්ටෝටල් පර්යේෂණ පැවැත් වූ බව සඳහන් වේ. සෑම පෞරයක්ම ප්‍රජාතන්ත්‍රවාදී නොවූ අතර, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේ සුප්‍රසිද්ධ නිදර්ශක රට ලෙස සැලකෙන්නේ ඇතෑන්ස්ය. ඇතෑන්ස් හමුදාපතිවරයෙකු වන පෙරික්ලස් (Pericles) ගේ කතාවක් අනුව එම මූලාශ්‍ර ගොඩ නැගී ඇති අතර, ඇතෑන්ස් රාජ්‍ය හා ස්පාටා රාජ්‍ය අතර, යුධ වැදී සිටියදී ඇතෑන්ස්හි මියගිය සෙබළුන්ගේ වීරත්වය සිහි කිරීමට පැවැත් වූ උත්සවයක දී පෙරික්ලස් මෙම කතාව සිදු කර ඇත. ඇතෑන්ස් හි සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කළද, එහි සියලු දෙනාටම එම අවස්ථාව ලැබී නොමැත. බහුතරයක් වූ වහලුනට හා ළමුන් හා කාන්තාවනට, විදේශිකයනට ඡන්දය හිමි වී නැත. අනෙකුත් පුරවැසියනට වාර්ෂිකව පවත්වන යම් නිලයකට තේරී පත්විය හැකි වී ඇති අතර, නිලධාරීන් තම ක්‍රියා කලාපය ගැන පුරවැසියනට උත්තර දීමට බැඳී සිට ඇත. නිලධාරීනට චෝදනා කිරීමට පුරවැසියකුට හැකියාව තිබූ අතර, ඇතෑන්ස් අධිකරණය මගින් එය පරීක්ෂා කොට වරදකරු වූවොත් දඬුවම් ලබාදී ඇත. සොක්‍රටීස්ට තරුණයන්ගේ සිත් දූෂණය කළ බවට චෝදනා කොට මරණ දඬුවම ලබා දෙන ලද්දේ මේ ආකාරයටය. අධිකරණය ද සමන්විත වූයේ සාමාන්‍ය පුරවැසියන් ගෙනි. ග්‍රීක පෞරව මූලික තැන දුන්නේ පුද්ගලයාට නොව පෞරවටය. පෞර රාජ්‍ය දේශපාලන සංවිධානයක් පමණක් නොවන සංස්කෘතික, ආගමික ඇතුළු සියලු සමාජ සම්බන්ධතා මෙහෙය වූ පුළුල් සංවිධානයක් විය. ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේ, රාජ්‍යයෙන් බැහැරව ජීවත් විය හැකියයි කෙනෙක් සිතන්නේ නම් ඔහු තිරිසනෙකු හෝ දෙවියෙකු විය යුතු බවය. මෙය අද අර්ථයෙන් ප්‍රජාතන්ත්‍රවාදයට වඩා ෆැසිස්ට්වාදයට සමීප වන අදහසකි. **නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ අදහස රාජ්‍ය අධිකාරයෙන් පුද්ගලයා නිදහස් කර ගැනීමය. එයින් මිදුණු තරමට ඔහු නිදහස් හා නිවහල් පුද්ගලයෙකු වන බව සැළකේ. ප්‍රජාතන්ත්‍රවාදයේ බීජය ග්‍රීක පෞරයන් තුළ ඇති වුවද, වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය ඒ හා සම්බන්ධයක් නොමැත. අද රාජ්‍ය ප්‍රමාණයෙන්ද, ජනගහනයෙන් ද වැඩි ජාතික රාජ්‍යයන් බවට පත්ව ඇත.**

## ඇතෑන්ස් ප්‍රජාතන්ත්‍රවාදය

යටතේ පාලන කටයුතුවලට හවුල් වීමට සෑම පුරවැසියෙකුටම අයිතියක් ලැබිණි. ඡන්දය ලබා දී මැතිවරණවලදී නියෝජිතයන් පත්කර ගැනීම පමණක් නොව ආණ්ඩුවේ කුමන හෝ ආයතනයක සාමාජිකත්වය ලබා එහි එදිනෙදා පරිපාලන කටයුතුවලට සහභාගීවීමට ද පුරවැසියෙකුට හැකිවිය. ඔවුනට ඒ අවස්ථාව ලැබුනේ ධනවතුන් හා වහල් හිමියන් වීම නිසා බව සමහර දේශපාලන විචාරකයන් ප්‍රකාශ කරන අතර, ප්ලේටෝ චෝදනාත්මකව දක්වා ඇත්තේ, රෙදි අපුල්ලන්නන්, සපත්තු මහන්නන්, වඩුවැඩ කරන්නන්, ගොවීන්, කම්මල්කරුවන් හා සුළු වෙළෙන්දන්ගෙන් පුරවැසි සභාවේ වැඩි දෙනා සමන්විත වූ බවය. ඇතෑන්ස් පාලන ක්‍රමයේ විද්‍යාමාන අංග වූයේ පුරවැසි සභාව, විධායක සභාව හා අධිකරණ සභාවයි. පුරවැසි සභාව වසරක් තුළ සැසිවාර දහයක් හා රැස්වීම් වාර හතළිහක් පැවැත්විය යුතු විය. පුරවැසියන් 3000-6000 අතර ප්‍රමාණයක් සහභාගී වූ මේ මගින් පරිපාලන කටයුතු කළ නිලධාරීන්ගේ ක්‍රියා පරීක්ෂාවට ලක් විය. මෙයට සහභාගි විය හැකි වූයේ අවු.30 ට වැඩි පිරිමි පුරවැසියනට පමණකි. විධායක සභාව සාමාජිකයන් 500 දෙදෙනෙකුගෙන් පමණ සමන්විත වූ අතර, කාලය වසර දෙකක් විය. මෙම සභාව දිනපතා රැස් වූ අතර, එදිනෙදා කටයුතු මෙහෙයවීමට 50 දෙදෙනෙකුගෙන් යුතු කමිටුවක් හා ඡන්දයෙන් තෝරාගත් සභාපතිවරයෙක් ද විය. පුරවැසි සභාවේ න්‍යාය පත්‍රය සකස් කිරීම සිදු කළේ විධායක සභාව විසිනි. පුරවැසියන්ගෙන් වාර්ෂිකව තෝරාගත් පුරවැසියන් 6000ක ගෙන් පමණ සමන්විත වූ අධිකරණ සභාව සභා කීපයකින් යුක්ත විය. එක් එක් සභාව තීරණය ගනු ලැබුවේ බහුතර ඡන්දයෙනි. සොක්‍රටීස් පඬිවරයාට තරුණයන්ගේ සිත් දූෂ්‍ය කිරීමේ වරදකට මරණීය දඬුවම පමුණුවන ලද්දේ මෙම අධිකරණ සභාවක බහුතර තීරණය විසිනි. අධිකරණ සභාව වුවද එය සාමාන්‍ය පුරවැසියන්ගෙන් යුතු එකක් විය.



මීට අමතරව පුරවැසියන්ගෙන් තෝරාගත් හමුදාපතිවරු 10 කින් යුතු මණ්ඩලයක් ද විය. හමුදාව සෑදුනේ හදිසි අවස්ථාවකදී සියලු පුරවැසියන් ආයුධ සන්නද්ධ කිරීමෙනි. පෙරික්ලිස් වසර 15 ක් ඇතෑන්ස්හි හමුදාපති ධූරය දැරීය.



# පැරණි ඉන්දීය ප්‍රජාතන්ත්‍රවාදය



ක්‍රි.පූ. 05-04 ශත වර්ෂවල ග්‍රීසියේ පෞර රාජ්‍ය ක්‍රමයට සමාන සමූහාණ්ඩු ක්‍රමයක් ඉන්දියාවේද පැවතී ඇත. බුද්ධ කාලයේ ඉන්දියාවේ ශාක්‍ය, මල්ල, වජ්ජි ජනපදවල දියුණු ප්‍රජාතන්ත්‍ර පාලන ක්‍රමයක් පැවති බවට රීස් ඩේවිඩ් පෙන්වා දෙයි. ග්‍රීසියේ විශාලම පෞර රාජ්‍ය වූ ස්පාටාව (ව.සැ 3360) විශාල වූ අතර, ඇතෑන්ස් පෞරවය ප්‍රමාණය ව.සැ. 1060 ක් විය. ඉන්දියාවේ ශාක්‍ය ජනපදය ද ඒ හා සමාන විශාලත්වයකින් යුක්ත විය. ශාක්‍ය පාලනය තුළ බහුතර ඡන්දයෙන් පත් වූ “සංඝ මුඛ්‍ය” නම් සභාපතිවරයෙකු වූ අතර, සභාවේ වැඩ කටයුතු හැසිරවීමට ලිපිකරුවෙක් ද විය. ගණපූර්ණය ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ඇති අතර, සභාවේ සංඛ්‍යාව විශාල වීම නිසා එදිනෙදා වැඩ කටයුතු කරගෙන යාමට පුරවැසියන් 5-6 දෙදෙනෙකුගෙන් යුතු කමිටුවක් ද වූ අතර, මෙය පුරවැසි සභාවට මුළුමනින්ම යටත් කොට තිබිණි, යුද හමුදාව පවා තෝරා ගනු ලැබුවේ පුරවැසි සභාව විසිනි. අද පවතින පාර්ලිමේන්තු ක්‍රමයේ බීජය ඉන්දියාවේ පැවති බෞද්ධයන්ගේ මන්ත්‍රණ සභාවල දක්නට තිබීම බොහෝ දෙනාට පුදුමයක් විය හැකි යයි සර්ටෙලන්ඩ් සාමිවරයා “ඉන්දියාවේ දායාදය” නැමති ග්‍රන්ථයේ සඳහන් කරයි.

# ප්‍රොතෙන්ත්‍රන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හා ලිබරල් වාදය

14,15,16 සියවස්වල යුරෝපයේ ඇති වූ සමාජ ආර්ථික වෙනස්කම් නිසා ඇති වූ ලිබරල්වාදය හා ප්‍රොතෙන්ත්‍රන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ද සාමූහික බව වෙනුවට පුද්ගලයා වැදගත් කොට සැලකීම, එම ව්‍යාපාරයේ ලක්ෂණය විය. “පූජකවරුන් මගින් නොව පුද්ගලයා කෙළින්ම දෙවියන්ට සම්බන්ධ කළ හැකිය” යන ප්‍රොතෙන්ත්‍රන්තවරුන්ගේ පුද්ගලවාදී ධර්මතාව රාජ්‍ය පාලනයේ ද මුල් බැස ගැනීමට මඟ පෙන්වීමක් විය.

# ප්‍රජාතන්ත්‍රවාදයේ ගමන් මගේ ඓතිහාසික විශේෂ අවස්ථා කීපයක්

ක්‍රි.ව 483-565 - රෝමයේ ජස්ටීනියන් අධිරාජ්‍යයා විසින් නීතියේ ආධිපත්‍ය තහවුරුවන නීති සකස් කිරීම.

1215-6-15 - එංගලන්තයේ ජෝන් රජු අත්සන් කළ මහා අධිකාර පත්‍රය (මැග්නාකාටා ප්‍රඥප්තිය) අත්අඩංගුවට ගැනීම, සිරකර තැබීමේ රජුගේ අත්තනෝමතික බලය ඉවත් කොට පාර්ලිමේන්තුවට බලය පැවරීම.

1265 - සයිමොන් ඩිමොන්පට්ගේ මූලිකත්වයෙන් එංගලන්තයේ ප්‍රථම වරට සැබෑ පාර්ලිමේන්තුවක් රැස්වීම.


1679 - නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම් අධිකරණය හමුවේ ප්‍රශ්න කිරීමේ හබයාස් කෝපස් (Heabeas Corpus) නීතිය සම්මත කර ගැනීම.

1688 - එංගලන්තයේ රජුගේ බලතල පාර්ලිමේන්තුවට පැවරෙන අයිතිවාසිකම් පනත සම්මත වීම.

1771 - ඇමරිකානු පාරම්පරික ජනතාව කැරළි ගසා ඇති කර ගන්නා ලද ඇමරිකානු ව්‍යවස්ථාව, (සියලු ජනපද වාසීන් පුරවැසියන් ලෙස සැලකීම).

1789 - ප්‍රංශයේ සාර් පාලනය ඉවත් කොට ඇති කරගත් ජනතා පාලනය මගින් ප්‍රකාශයට පත් කළ ප්‍රංශ නිදහස් ප්‍රකාශනය ලෝකයේ ප්‍රථම වරට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භය සිදු වූයේ ප්‍රංශයේදීය.

1832 - එංගලන්තයේ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ පනත මගින් ඡන්ද බලය පුළුල් කිරීම.



කෘෂි ආර්ථික ක්‍රමය වෙනුවට වෙළඳාම හා කාර්මීකරණය පදනම වූ නව ධනේශ්වර ආර්ථික ක්‍රමයක් බිහි වු අතර, රෝම අධිරාජ්‍ය හා රෝම පල්ලිය සතු වූ දේශපාලන ආධිපත්‍ය ධනේශ්වරයේ ආර්ථික ක්‍රමයේ වර්ධනයට බාධාවක් වූ බැවින්, ධනේශ්වරය විසින් එයින් මිදීමට කුමාරවරුන්ගේ හා ප්‍රාදේශීය පාලකයන්ගේ සහාය පතන ලදි. පරමාධිපති රාජාණ්ඩු ක්‍රමයකට පක්ෂව බටහිර දේශපාලන චින්තකයින් වූ මැකියවේලි, හොබ්ස්, බොඩැන් ආදීන් තර්ක ඉදිරිපත් කරන ලදී. ධනේශ්වර පංතිය අපේක්ෂා කළ ජාතික ස්වාධීනත්වය, අභ්‍යන්තරික සාමය රාජාණ්ඩු මගින් ප්‍රතිෂ්ඨාපනය කළද, 18,19 වන සියවස වන විට ඔවුන්ගේ ආර්ථික බලයට තර්ජනයක් වන්නා වූ දේශපාලන බල අධිකාරයක් ලෙස මෙම රාජාණ්ඩු ක්‍රමය නැගී සිටියේ ය. එයට ප්‍රතිකර්මයක් ලෙස නව දේශපාලන අධිකාරියක් සොයා ගිය ධනේශ්වරයා, තමන් අතට දේශපාලන බලය අත්කර දුන් “සමූහාණ්ඩු වාදයට” නැඹුරු විය. රාජාණ්ඩු ක්‍රමයට එරෙහිව සමූහාණ්ඩු ක්‍රමයක් සඳහා ගෙන ගිය සටන තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ඉස්මතු වූ අතර, ලිබරල්වාදය ද මේ සමග මතු වූ බව දේශපාලන චින්තනයකු වූ “සර්ටෝබි” පවසයි.

# ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටලු




18 වන සියවස අවසාන භාගය වන විට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවලට දේශපාලන අභියෝග හා තර්ජනවලට මුහුණ දීමට සිදුවිය. නීතිය ඉදිරියේ සමානාත්මතාවය හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් වලින්, දරුණු සූරාකෑමට ලක්ව සිටි කම්කරු පංතියට හා සුළු මධ්‍යම පාන්තික ජනතාවට කිසිම සෙතක් නොමැති බව පැහැදිලි විය. නීතිය ඉදිරියේ සමානාත්මතාව හා ඉන් ආරක්ෂාව ලැබෙන්නේ ධනවත් අයට පමණක් බව ද, පැහැදිලි විය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය මගින් සහතික කළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් භුක්ති විඳින්නේ ධනපති පංතිය නිසා එම ආණ්ඩු පෙරළා දමා එහි බලය වැඩ කරන ජනතාව අල්ලාගත යුතු බව සමාජවාදීහු ප්‍රකාශ කළහ. මෙම චින්තනයේ පෙරමුණ, කාල්මාක්ස් වැනි චින්තකයින් ගන්නා ලදී. ඔවුන් ප්‍රජාතන්ත්‍ර-වාදයට විරුද්ධ නොවූ අතර, එය ඉදිරියට ගෙන ගොස් “පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක්” බිහි කිරීම ඔවුන්ගේ අරමුණ වූ බව පෙනී යයි. බටහිර රටවල නිදහස් මැතිවරණ තිබුනද, හැම අවස්ථාවකම බලයට පැමිණ ඇත්තේ ධනේශ්වර පංතිය බවද පෙන්වා දෙන ඔවුහු, ආර්ථික සමානාත්මතාවය සහතික කිරීමකින් තොරව නීතිය මගින් සහතික කරන අයිතිවාසිකම්වලින් පමණක් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රිය අයිතිවාසිකම් රැකදිය නොහැකි බව පෙන්වා දෙයි.

බ්‍රිතාන්‍යයේ දේශපාලන චින්තකයෙකු වන හැරල්ඩ් ලැස්කි ප්‍රකාශ කර ඇත්තේ “රජය දේපළ පාලනය කළ යුතුය, නැතහොත් දේපළ විසින් රජය පාලනය කරනු ඇත” යනුවෙනි.










## ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක සාර්ථකත්වයට අවශ්‍යම ලක්ෂණ ලෙස හඳුනාගෙන ඇති කරුණු

1. සුළුතරයට අගතියක් නොවන හා ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය නොවන බහුතර පාලනය

2. සාකච්ඡා මගින් තීරණවල එළඹීම, විරුද්ධ මත ඉවසීම හා සම්මුතිවලට එළඹීම.

3. ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ වශයෙන් වෙන් වූ ස්වාධීන බලතල වෙන්ව තිබීම.

4. ව්‍යවස්ථානුකූල පාලනයට ගරු කිරීම
5. නීතිය ඉදිරියේ සමානාත්මතාවය හැරල්ඩ් ලැස්කි තවදුරටත් මෙම ලක්ෂණ පුළුල් කරමින් පහත සඳහන් ලක්ෂණ ද එකතු කරයි.

6. රජයේ වැඩකටයුතු ගැන විමසිල්ලෙන් සිටින පුරවැසි සමූහයක්
7. රාජ්‍යයේ සෑම ජන කොටසකටම බලයට පැමිණෙන පාලකයන් එක සේ සැලකීම

8. අන්‍ය අදහස්වලට ගරු කිරීම පුරුද්දක් වශයෙන් සමාජයේ තිබීම

9. ජාතියේ ඒකාබද්ධතාව ඇති කිරීමට හැකිවීම

## පුද්ගලික නිදහස ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක වඩා ප්‍රමුඛ වන අතර, ඒවා නම්

- **පෞද්ගලික නිදහස** - කතා කිරීමේ, සිතීමේ නිදහස හා අදහස් ප්‍රකාශ කිරීමේ භාෂණයේ නිදහස

- **දේශපාලන නිදහස** - ඡන්දය ප්‍රකාශ කිරීම, ඡන්ද අපේක්ෂකයෙකු වීම, පාලන බලය නීත්‍යානුකූලව ලබා ගැනීමට ඇති අයිතිය, දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම, ඒවාට බැඳී කටයුතු කිරීමේ නිදහස

- **ආර්ථික නිදහස** - රැකියාවක නිරත වීමේ අයිතිය වෘත්තිය සමිතියකට බැඳීම, සාධාරණ ලෙස මුදල් ඉපයීම, ඉතිරි කිරීම, දේපොළ භුක්ති විඳීම, ආරක්ෂාව ලැබීම, ආහාර, නිවාස, වෛද්‍ය පහසුකම් ලැබීම.

- **සංස්කෘතික නිදහස** - කැමති භාෂාවක් කතා කිරීම, කැමති ආගමක් ඇදහීම, කැමති අවාහ විවාහ සිරිත් හා වෙනත් සිරිත් විරිත් අනුගමනය කිරීම, අභිමත ලෙස අධ්‍යාපනය ලැබීම

## නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය

රටක භූමි භාගය ප්‍රසාරණය වන විට, ජනගහණය වර්ධනය වන විට සෘජු සහභාගීත්වයක් කළ නොහැකි වේ. ඒ සඳහා තමන්ගේ අභිලාෂයන්, අරමුණු නියෝජනය කිරීමට නියෝජිතයන් මගින් පාලනයට සහභාගී වීමට සිදු වේ. ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රායෝගික එකක් කළේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයයි. එය සඵලවීම සඳහා "සමාන ඡන්දය" හා "සඵල සහභාගීත්වය" අවශ්‍ය වේ. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රකාශනය, අවිය හා බලය ඡන්දයයි. දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදයේ හදවත වන්නේ නිදහස් හා සාධාරණ මැතිවරණ මගින් ඇති කරන ජනතා පාලනයයි. එවැනි ජනතා පාලනයක වැඩිදුරට පවතින ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණ වන්නේ,

## සර්වජන ඡන්ද බලය මගින් ආණ්ඩු හා පාලනයක් තෝරා ගැනීම

**තරඟකාරී පක්ෂ ක්‍රමය** - ප්‍රතිවිරුද්ධ මත නියෝජනය කිරීමට අවස්ථාව තිබීම, අහිතකර ක්‍රියා විවේචනය කිරීම හා අත්තනෝමතික ක්‍රියා වැළැක්වීම. මේ සඳහා ආණ්ඩු පක්ෂය මෙන්ම ශක්තිමත් විපක්ෂයක් ද තිබීම අවශ්‍යය

**ඡන්ද කොට්ඨාස ක්‍රමය** - සෑම ජන කොටසකම අදහස් නියෝජනය වීම, ප්‍රාදේශීය වශයෙන් වැඩි නියෝජනය

**නිදහස් හා සාධාරණ මැතිවරණය** - නියමිත කාලය තුළ මැතිවරණ පැවැත්වීම තම කැමැත්ත අනුව නියෝජිතයන් තෝරා ගැනීම. ඡන්ද අපේක්ෂකයෙකු ලෙස හා ඡන්ද දායකයෙකු ලෙස ක්‍රියා කිරීම. සමානාත්මතාවය හා නිදහස පදනම් කරගෙන ප්‍රජා ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම** - ක්‍රමවත් බව හා ස්ථාවර බව ක්‍රියාවල විනිවිද භාවය ඇතිවීම.

**මාධ්‍ය නිදහස හා තොරතුරු ලබා ගැනීමේ අයිතිය** - දැනුවත් භාවය වර්ධනය වීම. නිවැරදි තීරණයකට එළඹිය හැකි වීම.

**අධිකරණයේ ස්වාධීනත්වය** - නීතියට විරුද්ධ හෝ අයුක්ති සහගත ක්‍රියාවලට රැකවරණය ලැබීම. නීතියේ ආධිපත්‍ය හා නීතිය ඉදිරියේ සමානාත්මතාවය.

"නියෝජන ආණ්ඩුක්‍රමය" නැමති ග්‍රන්ථයේ ජෝන් ස්ටුවර්ට් මිල් ප්‍රකාශ කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක වැදගත්ම ගුණාංගය මහජනතාවට රාජ්‍යයේ ස්වාධිපති බලයේ කොටස්කරුවෙකු ලෙස ඇතුළු වීමට තිබෙන හැකියාවත් රටේ පරිපාලන කටයුතුවලට සහභාගී වීමට තිබෙන හැකියාවත් බවයි.

### සමාප්තිය

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික පරමාර්ථය සෑම පුද්ගයෙක්ම වර්ධනය කිරීමයි. පුද්ගලයන් සියලු දෙනාම එක්ව ගත්කල "මහජනතාව" වේ. එම නිසා මහජනතාව විසින් මහජනතාව පාලනය කළ යුතුය. එය රජ කෙනෙක්, ඒකාධිපතියෙක්, වංශාධිපතියෙක්, හමුදාවක්, ජුන්ටාවක්, හෝ ඒකාධිපති දේශපාලන පක්ෂයක් විසින් කරන පාලනයක් නොවිය යුතුය. එහිදී වඩා වැදගත් වන්නේ සුළුතර ප්‍රජාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය නොකරන බහුතර පාලනයයි. සුළුතර ප්‍රජාවගේ අයිතීන් උල්ලංඝණය වන පාලන ක්‍රමයට ප්‍රජාතන්ත්‍රවාදී සුජාත භාවය නොලැබේ. මිනිසාගේ ස්වාභාවික අයිතිවාසිකම් එනම්, ජීවිතය, නිදහස හා සතුට ලැබීමේ අයිතිය රැකදීම ප්‍රජාතන්ත්‍ර පාලනයේ පරමාර්ථය විය යුතු වේ.

ආයතනික වශයෙන් කොතෙකුත් හොඳ ප්‍රජාතන්ත්‍රීය විධිවිධානයන් යම් ආණ්ඩු ක්‍රමයකට ඇතුළත් කළද ජනතාව ඒ පිළිබඳ දැනුවත් භාවයෙන් තොර නම් හා ජනතාව ඒවාට ක්‍රියාශීලී ලෙස සහභාගී වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එයින් ලබාගත හැකි ප්‍රතිඵල අල්ප වන්නේය. ප්‍රායෝගික දේශපාලනය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රත්‍යක්ෂ කරගත හැක්කේ එම ආණ්ඩු ක්‍රමයන් ක්‍රියාත්මක කරන සමාජ හා ආර්ථික තත්ත්වයන්ගේ සංවර්ධනය හා දියුණුව මත බව දේශපාලන විචාරකයෝ පෙන්වා දෙති.

- නීතිඥ නිමල් පුංචිහේවා






# කැටපත් පවුර

## Democracy

The term democracy is derived from 'demos' and 'cratia' which respectively mean people and power; thus democracy means "power in the hands of the people."

Definition: Democracy is a form of government where sovereignty belongs to the people; the government is representative of and responsible to them; the purpose of the state is welfare of the people which includes the development of personalities of the citizens.

It is thus not only a form of government but a type of state as well as an order of society. According to Bryce, "democracy is that form of government in which the ruling power is vested not in any individual, or in a particular class or classes but in the members of community as a whole".

Dicey calls it "a form of government in which the governing body is comparatively a large fraction of the entire nation". Lincoln gave the historic definition of democracy as "government of the people, for the people, and by the people". Seeley defines democracy as a "government in which everybody has a share". According to Bassett, Democracy is essentially a matter of political method. Democracy is not a particular kind of civilization. It is rather a civilized way of taking political action. Democracy reconciles freedom with the need for law and its enforcement.

It may be defined as "political method by which every citizen has the opportunity of participating through discussion in an attempt to reach voluntary agreements as to what shall be done for the good of the community as a whole." In fact democracy is not only a form of government, it is also a way of life.

**- Sreen Yapa Boralessa**
(sources-http://www.preservearticles.com)

**සීත කඳුකර නුවරඑළියේ**
**ලැයිම් කාමර සිසාරා එන**
**හඬෙහි තේදළු සැලෙන රාවය**
**ගිගුම් දිය යුතු වේ ය, නිසි තැන...**

**මුහුදුකරයේ රැළි නැඟෙන හඬ**
**මුසු ව රැව් දෙන හෙලෙයියා නද**
**මුහුදු ලිහිණීන් පියාඹා යන**
**හැඬට මතු විය යුතු ය, නිසි තැන...**

**හෙට ලොවට මඟ කියන විදුඇස**
**මැවෙන සිහිනෙක රැඳුන විසිතුර**
**සැබෑ වන ඉසිඹුවක අසිරිය**
**තැබිය යුතු වේ ය, නිසි තැන...**

**එ'වූ නිසි තැන ඒ සුනිසි තැන**
**අපේ හදවත් එකට එක්වන**
**සොයා යා යුතු නුඹ මම ම මිස**
**වෙනත් කිසිවෙකු නොවිය යුතු ම ය...**

**නුඹේ හඬ ගෙන හඬ නඟන්නට**
**නුඹේ කඳුලින් සිනා පුබුදන**
**නිසි තැනැත්තන් සොයා යන්නට**
**හැකි නුඹට මිස අන් කවරෙකුට..?**

**නුඹ නමින් මිනිසෙක් සොයා යන**
**ඒ ගමන**
**ප්‍රජාතන්ත්‍රවාදය...**
**නුඹට නුඹ ගැන, නුඹෙ පුතුන් ගැන**
**සිතන්නට ඇති එක ම අඩවිය**
**ප්‍රජාතන්ත්‍රවාදය**
**නිසි තැනක, නිවැරදි ව රඳවන**
**දිනෙක නුඹ මදහස නැගෙනු ඇත...**

**- ලීලනාත් වික්‍රමආරච්චි**










# නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ඇරඹුම සමූපකාරයෙන්

සර්වජන ඡන්ද ක්‍රමය මේ වනවිට ලොව පුරා ව්‍යාප්ත වී අවසන්. තමන්ගේ පාලකයන් ඉන් බැහැර ක්‍රමයකින් තෝරා ගැනෙන රටවල් ලොව ඇත්තේ අල්පයක්.

එහෙත් ඔබ දන්නවාද ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට සිය පාලකයන් තෝරා පත්කර ගැනීම මුලින් ම ඇරඹුවේ සමූපකාර ව්‍යාපාරය විසින් බව?

1844 දෙසැම්බර් 21 දින ලොව ප්‍රථම සමූපකාර සමිතිය නම් වෙළෙඳ ආයතනය බිහි වූයේ වෙනත් ව්‍යාපාරවලට වඩා වෙනස් ආකාරයටයි. අඩු ආදායම්ලාභී පුද්ගලයින් 28 දෙනකු එක්ව සමාන කොටස් යොදා අරඹන ලද ඒ ව්‍යාපාරය නම් කෙරුණේ "The Rochdale Society of Equitable Pionees" යනුවෙන්. ව්‍යාපාරය ඇරඹූ අය රොච්ඩේල් පුරෝගාමීන් යනුවෙන් හැඳින්වෙනවා.

රොච්ඩේල් පුරෝගාමීන් සිය සමිතියට එකල ව්‍යවහාරයෙන් ඔවුන් දන්නා ප්‍රමාණයෙන් ව්‍යවස්ථාවක් නිර්මාණය කළා. ඒවා රොච්ඩේල් මූලධර්ම ලෙස හැඳින්වෙනවා.

ඔවුන්ගේ මූලධර්ම සංඛ්‍යාව අටක්. සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම, පාලනය සහ ව්‍යාපාරික කටයුතු මෙහෙයවීම මේ මූලධර්ම අටේ සංක්ෂිප්ත වශයෙන් දැක්වෙනවා.

මෙයින් පළමුවැන්න "ප්‍රජාතන්ත්‍රවාදී පාලනය" වන අතර දෙවැන්න "විවෘත සාමාජිකත්වය" ලෙස සඳහන්.

මේ වන විට ප්‍රජාතන්ත්‍රවාදය යනු නිශ්චිත අර්ථ නිර්ණයක් නැති සංකල්පයක්. එහෙත් රොච්ඩේල් පුරෝගාමීන් එය තමන්ගේ ව්‍යවස්ථාවට නොවෙසේ නම් වර්තමාන භාවිතයේ ආකාරයට කියනවා නම් අභිමතාර්ථවලට ඇතුළත් කළා.

සාමාජිකත්වය විවෘතයි. ස්ත්‍රී - පුරුෂ භාවය, කුලය, ධනය, බලය සාමාජිකත්වය දීමේ දී සලකා බැලුවේ නෑ. කොටස් කොපමණ මිල දී ගෙන තිබුණත් නිලධාරීන් තෝරා ගැනීමේ දී එක් පුද්ගලයකුට හිමි වන්නේ එක් ඡන්දයක් පමණයි.

එය තමා නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ ඇරඹුම. පසුව ලොව පුරා සංවර්ධනය වෙමින් පැතිරුණේ සමූපකාර සමිති සිය පාලකයින් තෝරා පත් කර ගැනීමට එදා උපයෝගී කරගත් ඒ පිළිවෙතයි.

**- එස්. නන්දලාල්**
















Designed by Chanaka Kumanayaka


**උපදේශක මණ්ඩලය**

මහින්ද දේශප්‍රිය
ජනාධිපති නීතිඥ නලින් ජේ අබේසේකර
මහාචාර්ය රත්නජීවන් එච්.හූල්
ආර්.එම්.ඒ.එල්.රත්නායක
එච්.එම්.ටී.ඩී. හේරත්
සමන් ශ්‍රී රත්නායක

**සංස්කාරක** - චන්න පී ද සිල්වා
**පරිගණක පිටුසැකසුම** - අමිල ප්‍රසාද් ගමගේ
**මුද්‍රණ උපදේශකත්වය** - කේ.ඩබ්.ජගත් චන්ද්‍රලාල් ද සිල්වා
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - පර්යේෂණ හා සැලසුම් අංශය
මැතිවරණ කොමිෂන් සභාව



**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**

සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl